දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
රුහුණ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2022 පුනර් පරීක්ෂණය

2022 නොවැම්බර් / දෙසැම්බර්

# ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න. කාලය : පැය තුනයි (03)

ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.

---

01. (i) ව්‍යාපාර චක්‍රයක විවිධ අවස්ථා කල්පිත සටහනක දක්වා එම එක් එක් අවස්ථාවේ දී ආර්ථිකයේ විද්‍යමාන විය හැකි ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර සහ ව්‍යාපාර වක්‍ර මගින් දැක්වෙන්නේ එකම සංකල්පයක්ද? එකිනෙකට වෙනස් සංකල්පයන් ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) 2015-2022 අතර කාලය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යාපාර චක්‍රයේ හැඩය කෙබඳු විය හැකිදැයි X අක්ෂයේ කාලය ද Y අක්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය ද දැක්වෙන දළ සටහනක් ඇඳ පෙන්වන්න. (සංඛ්‍යා දත්ත අවශ්‍ය නොවේ) (ලකුණු 02)

(iV) ඔබ විසින් අඳින ලද ව්‍යාපාර චක්‍රය මත ශ්‍රීලංකාව මේ වන විට ස්ථානගතවී සිටී යයි ඔබ විශ්වාස කරන ලක්ෂ්‍යය ලකුණු කරන්න. එම ලක්ෂ්‍යයෙන් පසුව ඉදිරි වසර දෙකක පමණ කාලය අප රට ගමන් කරතියි ඔබ අනුමාන කරන මාර්ගය දැක්වෙන සේ ඔබේ ව්‍යාපාර චක්‍රය 2024 දක්වා කැඩී ඉරකින් දීර්ඝ කරන්න. එම කොටසේ හැඩය තීරණය කිරීමේ දී ඔබ විසින් සලකා බලන ලද කරුණු මොනවා ද? (ලකුණු 06)

02. (i) ජාතික ගිණුම් සම්බන්ධ සාකච්ඡාවක දී අසන්නට ලැබෙන පහත සංකල්ප කෙටියෙන් විස්තර කරන්න.
   a) එකතු කළ වටිනාකම
   b) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය
   c) නිෂ්පාදකයාගේ මිල
   d) ශුද්ධ වක්‍ර බදු (ලකුණු 08)

(ii) පහත සඳහන් කටයුතු ජාතික ගිණුම් සැකසීමේ දී ඇතුළත් කරන්නේ ද නොකරන්නේ ද යන්න දක්වා එසේ ඇතුළත් කරන්නේ නම් ඒවායේ අගය ලබා ගන්නා ආකාරය දක්වන්න.

   a) සිංහරාජ වනාන්තරයේ වැඩෙන ශාකවල වටිනාකම පසුගිය වසරට වඩා මේ වසරේ වැඩිවී ඇත.
   b) අමරපාල ඉකුත් වසරේ රු.125,000කට මිලට ගත් යතුරු පැදිය මේ වසරේ රු.175,000 කට අලෙවි කළේය.

c) රජය මගින් පාසැල් පෙළ පොත් මුද්‍රණය කර සිසුනට නොමිලේ බෙදා දීම.

d) කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයේ පිහිටි කොරියානු සමාගමක් සිය වාර්ෂික ලාභයෙන් කොටසක් ඔවුනගේ රටට රැගෙන යාම. (ලකුණු 08)

(iii) රටක ආර්ථික කාර්යසාධනය ඇගයීමේ මිනුමක් ලෙස ඒක පුද්ගල අදායම යොදා ගැනීමේ දුර්වලතා කවරේ ද? (ලකුණු 04)

03. කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත ඇසුරෙන් ගණනය කරනු ලැබූ දළ දේශීය නිෂ්පාදිතය රු.මිලි. 1000ක් යයි සිතන්න. එම ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මත රාජ්‍ය වියදම (G) හැර සෙසු ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | C = 160 + 0.6Yd |
| පෞද්ගලික ආයෝජනය | I = 150 |
| රජයේ බදු අදායම | T = 100 |
| අපනයන අදායම | X = 75 |
| ආනයන වියදම | M = 125 |


(i) භාණ්ඩ හා සේවා මත රාජ්‍ය වියදම (G) ගණනය කරන්න. (ලකුණු 08)

(ii) සංක්‍රාම වියදම ශුන්‍ය නම් රජයේ අයවැය හිඟය / අතිරික්තය කොපමණ ද? (ලකුණු 02)

(iii) පෞද්ගලික ඉතුරුම් සහ ජාතික ඉතුරුම් ගණනය කරන්න. (ලකුණු 05)

(iv) මෙම රටේ දළ දේශීය නිෂ්පාදිතය රු.මිලි. 1100ක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ඔබට කළ හැකි යෝජනා කවරේ ද? (ලකුණු 05)

04. ශ්‍රී ලංකාවේ උද්ධමනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් උපුටා ගත් ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ.




(i) ආර්ථික විද්‍යාව පිළිබඳ අවබෝධයක් නැති අයෙකු වෙනුවෙන් ඔබ මෙම සටහන අර්ථ නිරූපනය කරන්නේ කෙසේ ද? (ලකුණු 08)

(ii) 2021 සැප්තැම්බර් මාසයෙන් පසුව ශ්‍රී ලංකාවේ උද්ධමනය වේගයෙන් ඉහළ යාමට හේතු වූයේ යයි ඔබ සිතන සාධක කවරේ ද? එම සාධක "ඉල්ලුමෙන් ඇදුන උද්ධමනය " හා "පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය" යන කොටස් දෙකට බෙදා දක්වන්න. (ලකුණු 08)

(iii) 2023 වසර අග වනවිට ශ්‍රී ලංකාවේ උද්ධමනය 5%-6% අතර අගයකට පහත වැටෙනු ඇතැයි මහ බැංකු අධිපති වරයා මාධ්‍ය සාකච්ඡාවක දී පැවසී ය. මෙම ප්‍රකාශය සත්‍ය වුවහොත්, ලබන වසර අවසානය වන විට අද පවත්නා භාණ්ඩ මිලෙහි කවර වෙනසක් ඇති වෙතැයි ඔබ බලාපොරොත්තු වන්නේ ද? (ලකුණු 04)

05.

| අයිතමය | 2020 අවසානයට | 2021 අවසානයට (අ) |
|---|---|---|
| 1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 834.8 | 1,005.1 |
| 1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | |
| 1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 193.8 | 220.6 |
| 2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු (ආ) | 129.6 | 300.7 |
| 3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ඇ) | 0.03 | 0.01 |
| 4. සංචිත මුදල් | | |
| 5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 536.1 | 675.4 |
| 6. පටු මුදල් සැපයුම, $M_1$ | | |
| 7. මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 7,318.6 | 8,179.0 |
| 8. පුළුල් මුදල් සැපයුම, $M_2$ (6 + 7) | 8,495.8 | 9,638.9 |
| 9. ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු | 909.9 | 1,008.4 |
| 10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, $M_{2b}$ | | |
| මුදල් ගුණකය, $M_{2b}$ | | |
| සංසරණ ප්‍රවේගය, $M_{2b}$ (ඉ) | 1.77 (ග) | 1.65 |

(අ) තාවකාලික

(i) ඉහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දත්ත වේ. (සියලු සංඛ්‍යා රුපියල් බිලියන වලිනි) එම සටහනේ අයිතම අංක 1.1, අංක 4, අංක 6 හා අංක 10 යටතේ තිබී මැකී ගොස් ඇති සංඛ්‍යා යළි එම ස්ථානවල පිහිටුවන්න. (ලකුණු 08)

(ii) 2021 වර්ෂය සඳහා M2b මුදල් ගුණකය ගණනය කර එය අර්ථ දක්වන්න. (ලකුණු 02)

(iii) මහ බැංකුව විසින් රු. මිලියනයක් වටිනා කාසි හා නෝට්ටු මුද්‍රණය කර සේවක වැටුප් ගෙවීම සඳහා ණයක් වශයෙන් රජයට ලබා දුන්නේ නම් M2b මුදල් සැපයුමේ අපේක්ෂිත වැඩිවීම කොපමණ ද? (ලකුණු 02)

(iv) 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම සැලකිය යුතු මට්ටමින් ඉහළ යාමට හේතු වූ කරුණු මොනවා ද? (ලකුණු 08)

06. කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. සියලු ස්වායත්ත අගයන් දී ඇත්තේ රුපියල් මිලියන වලිනි.

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | $C = 40 + 0.75Y^d$ |
| ආයෝජනය | $I = 140 - 10r$ |
| භාණ්ඩ හා සේවා මත රාජ්‍ය වියදම | $G = 100$ |
| රජයේ බදු අදායම | $T = 80$ |
| මූර්ත මුදල් ඉල්ලුම | $M^d = 0.2Y - 5r$ |
| මූර්ත මුදල් සැපයුම | $M^s = 85$ |

(i) මෙම ආර්ථිකයේ IS (භාණ්ඩ වෙළෙඳපොළ) සහ LM (මුදල් වෙළෙඳපොළ) වක්‍රවල සමීකරණ ලබා ගන්න. ඒ ඇසුරින් සමතුලිත පොලී අනුපාතය සහ අදායම් මට්ටම තීරණය කරන්න. (ලකුණු 10)

(ii) ආණ්ඩුවේ මිලදී ගැනීම රුපියල් මිලියන 65කින් ඉහළ දැමූ විට අදායම් මට්ටම වෙනස් වන ප්‍රමාණය, එනම් $\Delta Y$ ගණනය කරන්න. (ලකුණු 05)

(iii) ආණ්ඩුවේ මිලදී ගැනීම්වල වෙනස රාජ්‍ය වියදම් ගුණකයෙන් ගුණ කර ලබාගන්නා $\Delta Y = \left(\frac{1}{1-0.75}\right).\Delta G$ ආදායමේ වෙනස සහ $\Delta Y$ සඳහා ඉහත ඔබට ලැබුණ පිළිතුර අතර වෙනසට හේතුව ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 05)

07. (i) ශ්‍රී ලංකාවේ අල ඇණු වගා කරනවාට අඩු පිරිවැයකින් ඉන්දියාවේ වගා කළ හැකිය. නිරපේක්ෂ වාසි න්‍යාය අනුව ඒවා ලංකාවේ වගා නොකර ඉන්දියාවෙන් ආනයනය කිරීමට ඔබ යෝජනා කරනවා ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(ii) මෑත කාලීනව ශ්‍රී ලංකාව විදේශ සංචිත ක්ෂය වීමේ තර්ජනයකට මුහුණ පා සිටී. ගෙවුම් ශේෂ ලේඛනයේ කවර උප ගිණුම්වල ශේෂයන් දුර්වල වීම මෙම තත්වයට හේතු වී ඇත්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) a) පාවෙන විනිමය අනුපාත ක්‍රමයක් යටතේ වෙළෙඳ ශේෂය ස්වයංක්‍රීයව තුලනය විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

b) ශ්‍රී ලංකාව පාවෙන විනිමය අනුපාත ක්‍රමයක් අනුගමනය කරද්දී ලංකාවේ වෙළෙඳ ශේෂය දිගින් දිගටම සෘණ වීමට හේතුව ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් <u>හතරක් (04)</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

a) මුදල් ප්‍රමාණවාදයට පදනම් වූ විනිමය සමීකරණය
b) අධි බලැති මුදල් සැපයුම තීරණය කරන සාධක
c) විසර්ජන පනත හා පරිපූරක ඇස්තමේන්තුව
d) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර
e) තුලිත අයවැය ගුණකය
f) සර්පිලාකාර උද්ධමනය

(ලකුණු 5x4=20)

@@@@@@